# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම - 2019

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව - 2019 සඳහා ලියාපදිංචි වීමට පළමු වාරිකය වන රුː 15,000.00 ක් මුදල් ගෙවූ අයදුම්කරුවන් මේ වන විටත් ලියාපදිංචි කර අවසන් වී ඇති අතර ඉගෙනුම් උපකාරක සේවාවට (Learning Management System) අදාළ පරිශීලක (User Name) නාමය සහ මුරපදය (Password) ඇතුලත් ශිෂ්‍යභාවය තහවුරු කිරීමේ ලිපිය සහ ශිෂ්‍යය හැඳුනුම්පත මේ වන විටත් ලියාපදිංචි තැපැල මගින් අදාළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එවා ඇති බව දන්වමි.

මෙම පාඨමාලාවේ අධ්‍යයන වර්ෂය 2022 ජූනි 01 දින සිට ආරම්භ වන අතර සති 30ක් ගතවීමෙන් පසු පළමු වසර පරීක්ෂණ පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් දන්වමි.

මේ වන විටත් පළමු වාරිකය වන රුː 15,000.00 ගෙවා ලියාපදිංචි වීමට අපොහොසත් වූ යම් අයදුම්කරුවෙක් සිටී නම් 2022 ජූනි 30 දින දක්වා පළමු වාරිකය ගෙවීමට අවස්ථාව ලබා දී ඇති බව වැඩි දුරටත් දන්වමි.

තවද කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට ගෙවිය යුතු ගාස්තු පිළිබඳ දැනුම්දීම් අපගේ වෙබ් අඩවිය මගින් www.cdce.kln.ac.lk පමණක් කරනු ලබන අතර දුරකථන මාර්ගයෙන් ගෙවීම් පිළිබඳ කිසිදු දැනුවත් කිරීමක් සිදු නොකරන බව ද දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2022.05.30